JMC vLearning
"your virtual learning partner"

# නියෝජ්‍යත්ව නීතිය

නදීකා ප්‍රියදර්ශණී

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

- නියෝජ්‍යත්වය යනු, යම්කිසි පුද්ගලයෙක් තම පාලනයට යටත්ව, තමන් වෙනුවෙන් කටයුතු කිරීමේ බලය වෙනත් පාර්ශවයකට පැවරූ අවස්ථාවකදී හා එම බලය ලබා ගත් තැනැත්තා, බලය පවරන ලද පුද්ගලයා වෙනුවෙන් කටයුතු කිරීමට එකඟත්වය පළකල විටදී දෙපාර්ශවය අතර ඇති වන්නා වූ විශ්වාසනීයත්වයේ සම්බන්ධතාවය **<u>නියෝජ්‍යත්වය</u>** ලෙස හඳුන්වයි.

- ශ්‍රී ලංකාව තුළ නියෝජ්‍යත්ව නීතිය සම්බන්ධ සංගෘහිත කරන ලද පනතක් නොමැති අතර,
  - 1852 අංක 05 දරණ සිවිල් නීති ආඥා පනතේ 03 වන වගන්තිය ඉංග්‍රීසි නීතිය නියෝජ්‍යත්ව නීතිය සම්බන්ධ අදාළ වන බවට දන්වයි.
  - අධිකරණ තීරණ
  - 1902 අංක 04 දරණ ඇටෝර්නි බලතල පිළිබඳ ආඥා පනත ද නියෝජ්‍යත්ව නීතිය සම්බන්ධ ලංකාව තුළ අදාළ වේ.

- ගිවිසුමකට එළඹීමේදී නියෝජිතයාට ගිවිසුම් ශක්‍යතාවය තිබීම අවශ්‍ය නොවේ. නමුත්, ඔහුට එකී ගිවිසුම් සම්බන්ධව හොඳ අවබෝධයක් තිබිය යුතුයි. නමුත්, ප්‍රධානියාට ගිවිසුමකට එළඹීමේදී ගිවිසුම් ශන්නුතාවයක් තිබීම අනිවාර්යය වේ. මන්දයත්, ප්‍රධානියා සහ තුන්වන පාර්ශවය අතර ගිවිසුම එළඹෙන නිසාවෙනි.

### ප්‍රධානියා හා නියෝජිතයා අතර සම්බන්ධතාවය ඇති වීම.

ප්‍රධානියා හා නියෝජිතයා අතර සම්බන්ධතාවය පහත ආකාරයට ඇති විය හැක. එනම්,

I. ප්‍රකාශිත එකඟත්වය මඟින්
II. ව්‍යංග එකඟත්වය මඟින්
III. අපරානුමැතියෙන්
IV. අවශ්‍යතාවය මත
V. ප්‍රතිබන්ධනය හේතුවෙන්

### (i) ප්‍රකාශිත එකඟත්වයක් මත නියෝජ්‍යත්වය ඇති වීම

ප්‍රධානිය විසින් සිය නියෝජිතයාව ඍජුවම නම් කිරීම මෙහිදී සිදු වේ.

මෙයට යම්කිසි විධිමත් පටිපාටියක් අවශ්‍ය නොවන බැවින් ලිඛිතව හෝ වාචිකව ද සිදු කළ හැකිය.

**වාචිකව පත් කිරීම**

මෙහිදී ප්‍රධානියා විසින් නියෝජිතයාව වාචිකව පත් කිරීම සිදු කරයි. වාචිකව පත් කිරීම සිදු කළ ද ලිඛිතව මෙන්ම වාචිකව ද ගිවිසුම් වලට එළඹීමේ හැකියාව පවතී.

**ලිඛිතව පත් කිරීම**

ප්‍රධානියෙකු විසින් නියෝජිතයෙකු ලිඛිතව පත් කරන අවස්ථා දෙකක් දැකිය හැක. එනම්,

(i) ලිඛිත ලියවිල්ලක් මඟින් පත් කිරීම.

(ii) ඔප්පුවක් මඟින් එනම්, ඇටෝර්නි බලපත්‍රය හරහා පත් කිරීම. (Power of Attorney)


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### (ii) ව්‍යංග එකඟතාවයක් මත නියෝජ්‍යත්වය ඇති වීම

ප්‍රධානියෙකු විසින් සිය නියෝජිතයා යම් තනතුරක තැබීම හේතුකොට ගෙන ප්‍රධානියා වෙනුවෙන් එම තනතුරේ කටයුතු කරගෙන යාමට, අවශ්‍ය සාමාන්‍ය බලයෙන් කිසියම් කොටසක් ප්‍රකාශිතව දී නොමැති අවස්ථාවක නියෝජිතයා හට ප්‍රකාශිතව හිමි නොවුන ද, තනතුරේ ස්වාභාවය මත හෝ එම තනතුර සම්බන්ධ සාම්ප්‍රදායික හා පිළිගත් පරිචයන් අනුව ස්වාභාවිකවම ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කිරීමට බලය නියෝජිතයාට හිමි වීම හේතු කොටගෙන, ප්‍රධානියා හා නියෝජිතයා අතර ඇතිවන නියෝජ්‍යත්වය ව්‍යංග නියෝජ්‍යත්වයයි.

**උදාහරණ:**

අමල් ඔහුගේ බස් රථය ඇඟලුම් කර්මාන්තශාලාවක කුලී පදනමට ධාවනය කිරීමට යොදවා ඇත. අමල් ඔහුගේ කාර්යය බහුලත්වය නිසා සපුමල්ට සිය බස් රථය ඇඟලුම් කර්මාන්තශාලාවේ කුලී පදනමට ධාවනය කරවීමට බාර දී ඇත. බස් රථය නඩත්තු කිරීමේත්, ධාවන කාල සටහන් තීරණය කිරීමේත්, අලුත්වැඩියා කටයුතු කිරීමේත්, ඇඟලුම් කර්මාන්තශාලාවෙන් මුදල් ලබා ගැනීමේත් බලය සපුමල්ට පවරා ඇත. එම කාර්යයන් අමල් හා සපුමල් අතර ඇත්තේ ප්‍රකාශිත නියෝජ්‍යත්වයකි.

අමල් විසින් ප්‍රකාශිතව ප්‍රකාර කර නොමැති වුවද බස් රථයට සුදුසු රියදුරෙක් හා සහයකයෙක් යෙදවීමට සපුමල්ට බලයක් ඇති බව දෙදෙනා අතර පවතින අනුයෝජිත්ව සම්බන්ධතාවයේ ස්වරූපය අනුව පෙනී යයි. එලෙස ප්‍රධානියා හා නියෝජිතයා අතර පවත්නා සම්බන්ධතාවයේ ස්වරූපය හේතුකොට ගෙන අමල්ට ස්වභාවිකම ලැබුණා වූ බලය ව්‍යංග බලයයි. ඒ අනුව බස් රථයට සුදුසු රියදුරෙක් හා සහයකයෙක් බඳවා ගැනීම සම්බන්ධයෙන් අමල් හා සපුමල් අතර පවතින්නේ ව්‍යංග නියෝජ්‍යත්වයකි.

- <u>Hely – Huchinson</u> V. <u>Brayhead Ltd.</u> (1968) 1 QB B 549.

  Richard, Brayhead Ltd හි කළමනාකාර අධ්‍යක්‍ෂකවරයා වේ. Richard Ltd, Perdio Electronis Ltd හි කොටස් හිමිකාරීත්වය දරයි. Perdio Electronis Ltd විසින් Hely-Huchinson සමාගමෙන් අත්තිකාරකමක් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින අතරතුර අත්තිකාරම් ලබා ගැනීම පහසු කිරීම සඳහා Richard, Brayhead Ltd හි කළමනාකාර අධ්‍යක්‍ෂවරයා වශයෙන් එකී ණය ගිවිසුම සම්බන්ධයෙන් හානි පූර්ණය කිරීමට එකඟ වේ. ඒ අනුව Hely-Huchinson විසින් Perdio Electronis Ltd වෙත / 45,000 ක මුදලක් ප්‍රදානය කරයි.

  කෙසේනමුත් ණය මුදල ලබා ගැනීමෙන් අනතුරුව Perdio Electronis Ltd විසුරුවා හරිනු ලබන අතර Hely-Huchinson විසින් Brayhead Ltd වෙතින් වන්දි පූර්ණ ගිවිසුම යටතේ ණය මුදල් ආපසු ඉල්ලා සිටී. එහිදී අධිකරණය ප්‍රකාශ කර සිටින්නේ Brayhead Ltd වෙනුවෙන් හානිපූර්ණය ගිවිසුමකට එළඹීමට කළමනාකරණ අධ්‍යක්‍ෂවරයා වෙත ප්‍රකාශිත අධිකාරියක් ලබා දී නොමැති වුවද ඔහු දරන ධූරය අනුව එවන් ගිවිසුමකට එළඹීමේ ව්‍යංග බලය Richard සතු වන බවයි. ඒ අනුව ඔහු විසින් ඇති කරගත් හානිපූර්ණය ගිවිසුම සම්බන්ධයෙන් ප්‍රධානියා වශයෙන් Brayhead Ltd වගකිව යුතුය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- Watteau V. Fenwick (1893) 1 QB 346.

  A විසින් B වික්ටෝරියා හෝටලයේ කළමනාකරු වශයෙන් පත් කරන ලදී. එමෙන්ම A,B ට සිගරට් ණයට ගැනීම තහනම් කළේය. මෙම තහනම නොසලකා B විසින් C ගෙන් සිගරට් ණයට ගන්නා ලදී. C ඔහුට හිමි මුදලa A ප්‍රධානියා වශයෙන් ගෙවිය යුතු යැයි තර්ක කළ අතර A විසින් කියා සිටියේ තමාගේ බලයෙන් පිටත C කටයුතු කර ඇති නිසා තමා වගකීමට නොබැඳෙන බවයි. මෙම අවස්ථාවේදී අධිකරණය ප්‍රකාශ කළේ B හට සිය ව්‍යංග බලය යටතේ හිමි වන බලයට ඇති සීමාව පිළිබඳව C දැනුවත් කර නොමැති නිසා A හා B අතර ව්‍යංගයෙන් නියෝජ්‍යත්වයක් ඇතිවන බවත් ප්‍රධානියා ලෙස A අදාල මුදල C ට ගෙවිය යුතු බවත්ය.

### ව්‍යංග නියෝජ්‍යත්වයේ සුවිශේෂී අවස්ථා

(i) ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර ඇති වන ව්‍යාංග නියෝජ්‍යත්වය විවාහය පදනම් කොටගෙන ස්වාමිපුරුෂයා සහ භාර්යාව ව්‍යංගයෙන් නියෝජ්‍යත්වය පැන නැගේ. එනම් මෙහිදී විවාහය හේතුකොටගෙන පැන නගින්නා වූ පොදු ගෙදර දොරේ කළමනාකාරිණිය ලෙස සලකන්නේ භාර්යාවයි. එමනිසා භාර්යාව විසින් පොදු ගෙදර දොරේ අවශ්‍යතා සම්බන්ධයෙන් තෙවන පාර්ශවයක් සමඟ ගිවිසුමකට එළඹි විට ඇති වන ව්‍යංග නියෝජ්‍යත්වය නිසා ඉන් ස්වාමිපුරුෂයා වගකීමට බැඳේ.

(ii) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර ඇතිවන ව්‍යාංග නියොජ්‍යත්වය 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 03 වන වගන්තියේ විධි විධාන ප්‍රකාර හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වයක් පවතී.

  ඒ අනුව හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙකු අනෙකුත් හවුල්කරුවන්ගේ ප්‍රධානියෙකු හා නියෝජිතයෙක් වන අතර හවුල් ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු අතරතුරදී එක් හවුල්කරුවෙක් කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් අනෙක් හවුල්කරුවන් ප්‍රධානියෙකු ලෙස වගකීමට යටත් වේ.

### (iii) අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය ඇති වීම

යම්කිසි අවස්ථාවක නියෝජිතයා විසින් සිය ප්‍රධානියා පවරන ලද වගකීමට පටහැනිව කටයුතු කරන්නේ නම්, සාමාන්‍ය රීතිය ප්‍රකාරව ප්‍රධානියා එකී ක්‍රියාවන් සම්බන්ධයෙන් වගකීමට නොබැඳේ.

නමුත්, එම ක්‍රියාව ප්‍රධානියා විසින් පසුව අනුමත කර ඇති අවස්ථාවක දී ප්‍රධානියා හා නියෝජිතයා අතර අපරානුමැතියෙන් ලිඛිතව, වාචිකව හෝ ප්‍රධානියාගේ හැසිරීමක් මඟින් සිදු විය හැක. කෙසේනමුත්, ප්‍රධානියාගේ නිහඬත්වය අපරානුමැතිය ලෙස නොසැලකේ.

## අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය ඇති වීමේදී බලපාන රීති

(i) නියෝජිතයා ප්‍රධානියා පිළිබඳ හෙළිකරමින් ගිවිසුමට එළඹිය යුතුයි.

එනම් මෙහිදී නියෝජිතයා පෞද්ගලික නමින් නොව ප්‍රධානියා පිළිබඳ හෙළි කරමින් ගිවිසුමට ඇතුළු විය යුතුයි. නියෝජිතයා පුද්ගලික නමින් ගිවිසුමට ඇතුළු වී ඇත්තේ නම්, ප්‍රධානියාට අපරානුමැතිය ලබා දිය නොහැක.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

<u>Keighly Maxted</u> V. <u>Durrant</u> (1901) AC 240

යම් නිශ්චිත මිලකට ධාන්‍ය මිලට ගැනීම සඳහා ප්‍රධානියා විසින් නියෝජිතයෙකු පත්කර තිබේ. නියෝජිතයා එම නිශ්චිත මිලට වඩා වැඩි මිලකට ධාන්‍ය මිලට ගෙන තිබූ අතර ගිවිසුමට එළඹ තිබුණේ සිය පෞද්ගලික නමින් වන අතර තමා නියෝජිතයෙකු බව හෙළිදරව් කොට නොතිබුණි. මෙම ගිවිසුම සඳහා පසුව ප්‍රධානියා විසින් අනුමැතිය දෙනු ලැබුව ද මේ සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණය ප්‍රකාශ කලේ මෙහිදී නියෝජිතයා තමා නියෝජිතයෙකු බව හෙළිකොට නොතිබූ නිසා ප්‍රධානියාට අපරානුමැතිය ලබා දීමට නොහැකි බවය.

(හෙළිදරව් නොකරන ලද ප්‍රධානියා පිළිබඳ නීති තත්ත්වය මෙම පරිච්ඡේදය තුළ පසුව සඳහන් කෙරේ.)

(ii) නියෝජිතයා ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී ප්‍රධානියාට ගිවිසුම් ශක්‍යතාවය තිබිය යුතුය.

<u>Kelner</u> V. <u>Baxter</u> (1866) LR 2 CP 174

මෙහිදී හොටෙල් සමාගමක් ලියාපදිංචි කිරීමට කටයුතු කරමින් සිටි ප්‍රවර්තකයෙක් ඉතා ලාභයට ලැබුණු විස්කි තොගයක් හොටෙල් සමාගමේ ප්‍රයෝජනයට ගැනීමේ අදහසින් හොටෙල් සමාගම වෙනුවෙන් ණය පදනමට ගන්නා ලදී. පසුව හොටෙල් සමාගම මෙම විස්කි තොගය සමාගමේ ප්‍රයෝජනයට ගන්නා ලදී. (එනම් ප්‍රධානියා වශයෙන් සමාගම පසුව අනුමැතිය දෙන ලදී) හොටෙල් සමාගම කාලයකදී බංකොලොත් වීම නිසා විස්කිවල මුදල් අයකර ගැනීමට විස්කි සැපයූ පුද්ගලයා ප්‍රවර්තකයාට එරෙහිව පැවරූ නඩුවේදී මෙම සිද්ධිය පිළිබඳව අදහස් දැක් වූ අධිකරණය ප්‍රකාශ කලේ ප්‍රවර්තකයා ගිවිසුමට ඇතුලත් වන අවස්ථාවේදී හෝටල් සමාගමට ගිවිසුම් ශක්නුතාවයක් නොතිබූ බැවින් මෙහිදී අපරානුමැතියක් ඇති වුවද එය වලංගු අනුමැතියක් නොවන බව ප්‍රකාශ කර සිටියේය.

කෙසේවෙතත් මෙම රීතියට ව්‍යතිරේඛී අවස්ථාවක් 2007 අංක 07 දරන සමාගම් පනත තුළ දැක්වේ. සමාගම් පනත් අනුව අනාගත සමාගමක් වෙනුවෙන් ප්‍රවර්තකයින් විසින් එළඹෙන්නා වූ ගිවිසුම් වලංගු ගිවිසුම් ලෙස සැලකේ.

(ගිවිසුමේ ශක්නුතාවය පිළිබඳව ගිවිසුම් නීතිය පරිච්ඡේදයේ සාකච්ඡා කොට ඇත)


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

(iii) ගිවිසුමේ සියළුම ප්‍රධාන කරුණු නියෝජිතයා විසින් ප්‍රධානියාට හෙළි කල යුතුයි.

(iv) ප්‍රධානියා විසින් සම්පූර්ණ ගිවිසුමට අනුමැතිය ලබා දිය යුතුයි. ගිවිසුමේ කොටසට පමණක් ලබා දෙන අනුමැතිය වලංගු අපරානුමැතියෙක් නොවේ.

(v) සාධාරණ කාලයක් ඇතුලත අනුමැතිය දිය යුතුය.

(vi) ප්‍රධානියාට අපරානුමැතිය ලබා දිය හැක්කේ වලංගු සහ නීත්‍යානුකූල ගිවිසුම් වලට පමණි.

<u>Brook</u> V. <u>Hook</u> (1871) LR 6

මෙහිදී නියෝජිතයෙකු ප්‍රධානියා ගිවිසුමකට එළඹීමේදී ප්‍රධානියාගේ අත්සන කූට රචනය කොට තිබුණි. ව්‍යාජ අත්සන් තැබීම නිසා නීති විරෝධී ක්‍රියාවක් වන බැවින් හා එවැනි ගිවිසුම් මුල සිටම අවලංගු වන බැවින් එම ගිවිසුම ප්‍රධානියාට අපරානුමත කළ නොහැකි බව අධිකරණය විසින් ප්‍රකාශ කරන ලදී.

වලංගු අපරානුමැතියකින් පසුව ඇතිවන නියෝජ්‍යත්වයක් හේතුවෙන් ප්‍රධානියා වගකීමට බැදෙන්නේ අතීතානුනයෝගීවය. එනම් නියෝජිතයා ගිවිසුම ඇති කරගත් දිනයේ සිටය.

**(iv) අවශ්‍යතාවය මත නියොජ්‍යත්වය ඇති වීම.**

නියෝජිතයා යම්කිසි කාර්යයක් සම්බන්ධයෙන් සිය ප්‍රධානියාගේ උපදෙස් පැතිය නොහැකි හදිසි අවස්ථාවක ප්‍රධානියා වෙනුවෙන් ගිවිසුමට සැලසේ නම්, එවැනි අවස්ථාවේදී අවශ්‍යතාවයෙන් නියෝජිත සම්බන්ධයක් ඇති වී නියෝජිතයාගේ ක්‍රියාවෙන් ප්‍රධානියා වගකීමට බැඳේ.

අවශ්‍යතාවයේ නියොජ්‍යත්වය ඇති වීම සඳහා පහත කරුණු සම්පූර්ණ විය යුතුයි.

1) ප්‍රධානියාගේ උපදෙස් ලබා ගත නොහැකි තරමේ හදිසි අවශ්‍යතාවයක් උද්ගත වී තිබිය යුතුයි.

2) එය සත්‍ය වාණිජමය අවශ්‍යතාවයක් විය යුතුයි.

3) නියෝජිතයා විසින් ප්‍රධානියා වෙනුවෙන් සද්භාවයෙන් ක්‍රියාකොට තිබිය යුතුයි.

4) නියෝජිතයා විසින් ගන්නා ලද පියවර සාධාරණ විචක්ෂණශීලී විය යුතුයි.

5) ප්‍රධානියා විසින් පටහැනි ආකාරයේ ප්‍රකාශිත උපදෙස් පූර්වයෙන් ලබා දී නොතිබිය යුතුයි.

<u>G. N. Railway V. Swa field</u>

මෙහිදී එක් දුම්රිය ස්ථානයක සිට තවත් දුම්රිය ස්ථානයකට දුම්රියෙන් අශ්වයෙකු ප්‍රවාහනය කිරීමට දුම්රිය සමාගමට බාර දෙන ලදී. අශ්වයා නියමිත ගමනාන්තය තෙක් දුම්රියෙන් ප්‍රවාහනය කරණු ලැබුව ද අශ්වයා බාර ගැනීමට කිසිවකු නොමැති නිසා දුම්රිය සමාගම අශ්වයා ස්තාලයකට ඇතුලත් කොට කෑම ද සැපයුහ. දින කිහිපයකට පසු අයිතිකරු අශ්වයා ඉල්ලා සිටි විට ස්තාල වියදම් ගෙවන ලෙස අශ්වයාගේ අයිතිකරුගෙන් දුම්රිය සමාගම ඉල්ලා සිටින ලද අතර අයිතිකරු එය ප්‍රතික්ෂේප කරන ලදී. එම ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

දුම්රිය සමාගම විසින් පවරනු ලැබූ නඩුවේදී අධිකරණය ප්‍රකාශ කලේ නියෝජිතයා වශයෙන් දුම්රිය සමාගම බලයෙන් තොරව මෙසේ ගිවිසුමට එළඹුණ ද එසේ කටයුතු කර ඇත්තේ අවශ්‍යතාව මත නියෝජිතයා වශයෙන් වන හෙයින් අයිතිකරු ඉස්තාල වියදම් ගෙවිය යුතු බවයි.

Springer V. Great Western Railway (1921) 1 KB 257

මෙහිදී නැවකින් ආනයනය කොට ගෙනෙමින් තිබෙන තක්කාලි තොගයක් වරායේ සිට S ගේ ව්‍යාපාරය දක්වා ප්‍රවාහනය කිරීමට දුම්රිය සමාගමක් පත් කරන ලදී. තක්කාලි සහිත නැව වරායට පැමිණියේ දින කිහිපයක් ප්‍රමාදවය. මේ වන විට නැවේ තිබුණු තක්කාලි නරක් වෙමින් පැවති නිසා දුම්රිය සමාගම විසින් ඒවා අඩු මිලකට විකිණීය. එමඟින් සිදු වූ අලාභය ඉල්ලා S විසින් දුම්රිය සමාගමට විරුද්ධව නඩු පවරන ලදී. මෙහිදී අධිකරණය ප්‍රකාශ කලේ S පදිංචිව සිටි ස්ථානය දුම්රිය සමාගම දැන සිටි නිසා දුම්රිය කළ යුතු හොඳම දෙය වූයේ S ගෙන් උපදෙස් පැතීමයි. ඒ අනුව S හා දුම්රිය සමාගම අතර අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය පැන නොනඟින අතර S වෙත අලාභ ගෙවීමට දුම්රිය සමාගමට සිදු වේ.

**(v) ප්‍රතිබන්ධනය හේතුවෙන් නියෝජ්‍යත්වය ඇති වීම.**

ප්‍රතිබන්ධන රීතියේ බලපෑම හේතුකොටගෙන ඇති වන්නා වූ නියෝජ්‍යත්වය ප්‍රතිබන්ධන නියෝජ්‍යත්වයයි. එනම්, මෙහිදී යමෙක්, තවත් පුද්ගලයෙකු සිය නියෝජිතයා යැයි හැඟෙන පරිදි තුන්වන පාර්ශවයක් සමඟ කටයුතු කර ඇති නම්, පසුව ඇතිවන අවස්ථාවකදී සත්‍ය වශයෙන් ඔහු තමාගේ නියෝජිතයෙකු නොවුණ ද, ඔහු තමාගේ නියෝජිතයෙකු නොවන බව ප්‍රකාශ කළ නොහැක.

Freeman and Lockyer V Buckhurt Part Properties Ltd. (1964) 2 QB 480

X සමාගමක අධ්‍යක්ෂවරයෙක් විය. එම සමාගමේ තවත් අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් විය. X එම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පෙනී සිටිමින් කටයුතු කරන ලදී. සත්‍ය වශයෙන් ඔහු එසේ පත්කර නොමැති වුවද අනෙක් අධ්‍යක්ෂවරුන් ඊට විරෝධය නොපාන ලදී. X තමා සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා යැයි පවසමින් E ගෙන් සමාගමට අවශ්‍ය වන ගෘහ නිර්මාණ සැලසුමක් ලබා ගැනීම සඳහා ගිවිසුමකට එළඹීය. E විසින් පසුව ගෘහ නිර්මාණ සැලසුමේ මිල ඉල්ලා සමාගමට විරුද්ධව නඩු පැවරූ අතර එහිදී අධිකරණය කියා සිටියේ X සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වුවද ඔහු සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පත්කර නොමැති නිසා C මෙවන් ගිවිසුමකට එළඹීමට අධිකාරිය නොමැති බවයි. අධිකරණය ප්‍රකාශ කලේ X යන අය සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ අතර ඒ බව අනෙක් අධ්‍යක්ෂවරුන් දැන සිටි නමුත් ඒ සඳහා ඔවුන් විරුද්ධ නොවූ හෙයින් X යන අය ප්‍රතිබන්ධනයෙන් සමාගමේ අධ්‍යක්ෂකවරයා බවට පත්වන හෙයින් ඔහු විසින් E සමඟ එළඹියා වූ ගිවිසුම සම්බන්ධයෙන් සමාගම වගකීමට බැඳිය යුතු බවයි.

## විවිධ නියෝජිතයන් වර්ග

**I. වෙළඳ නියෝජිතයන්**

වෙළඳ නියෝජිතයෙක් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී වෙනත් අය වෙනුවෙන් භාණ්ඩ විකිණීම හෝ මිලදී ගැනීම වෙනුවෙන් ගිවිසුම් වලට ඇතුළත් වන අයවලුන් වේ. මෙවන් නියෝජිතයෙකුට තමන් විකුණන හෝ මිලට ගන්නා භාණ්ඩවල භුක්තිය කෙටි කාලීනව ලැබේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### II. තැරැව්කරුවන්

තැරැව්කරුවන් ද තමන්ගේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී වෙනත් අය වෙනුවෙන් භාණ්ඩ විකිණීම සඳහා හෝ මිලදී ගැනීම සඳහා හෝ ගිවිසුම් වලට ඇතුළත් වේ. වෙළඳ නියෝජිතයෙකු මෙන් විකුණා හෝ මිලදී ගන්නා භාණ්ඩවල භුක්තිය සාමාන්‍යයෙන් නොලැබේ.

### III. වෙන්දේසිකරුවන්

විකුණුම්කරු වෙනුවෙන් ප්‍රසිද්ධ හෝ පෞද්ගලික වෙන්දේසියේ දේපොල විකුණනු ලබන තැනැත්තා වෙන්දේසිකරු වේ.

## සමාගමක අධ්‍යක්ෂවරුන් හා හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්

හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අනෙකුත් හවුල්කවරුන්ගේ නියෝජිතයෙක් ලෙස සැලකෙන අතර සමාගමක අධ්‍යක්ෂවරුන් සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව අධිකාරිය පවරා දුන් සමාගමේ නියෝජිතයෙක් සේ සැලකේ.

## සාකල්‍යතා නියෝජිතයා

යම් ප්‍රධානියෙකුගේ සියළුම කටයුතු පිළිබඳව ක්‍රියා කිරීමට ඇති ලෙස මෙම නියෝජිතයා හැඳින්විය හැක. බොහෝවිට මෙම නියෝජිතයන් ඔප්පුවක් මඟින් පත් කෙරේ.

## නීතිඥවරුන්

සිවිල් නඩුවක් සම්බන්ධයෙන් පෙරකලාසියක් මත පත් කළ ලේඛනගත නීතිඥවරයා එම නඩුවට සේවදායකයාගේ නියෝජිතයාගේ ලෙස සැලකේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**නියෝජිතයාගේ බලය / අධිකාරිය**

**සත්‍ය බලය**
මෙයින් අදහස් වන්නේ ප්‍රකාශිත ලෙස නියෝජිතයාට ලැබී ඇති බලයකි.

**ව්‍යංග බලය**
ප්‍රධානියා විසින් නියෝජිතයා තනතුරේ පිහිටුවීමේදී සියල්ල ඔහු වෙත ප්‍රකාශිතව පවරා දිය නොහැක.

සිය තනතුරේ කටයුතු කිරීමට නියෝජිතයාට අවශ්‍ය යම් අධිකාරියක් ප්‍රකාශිතව හිමි නොවුණ ද නියෝජිතයා දරන්නා වූ තනතුරේ ස්වභාවය මත හෝ එම තනතුර සම්බන්ධ සාම්ප්‍රදායික හා පිළිගත් පරිචයක් අනුව, ස්වාභාවිකවම ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කිරීමට නියෝජිතයාට ලැබෙන බලයකි.

**විද්‍යාමාන බලය**
කිසියම් ප්‍රධානියෙකු විසින් තම නියෝජිතයාට තිබෙන්නේ යැයි විශ්වාස කිරීමට තෙවන පාර්ශවයක් පෙළඹවීම හේතුකොට ගෙන ඇති වන්නා වූ බලයයි.

## ප්‍රධානියෙකුගේ සහ නියෝජිතයෙකුගේ අයිතීන් හා යුතුකම්

### නියෝජිතයාගේ යුතුකම්

**i. ප්‍රධානියා විසින් දෙනු ලබන උපදෙස් පිළිපැදීම**

සාමාන්‍ය රීතියක් ලෙස නියෝජිතයා විසින් ප්‍රධානියා ලබා දුන් සාධාරණ හා නීතිවිරෝධී නොවන උපදෙස් වලට අනුගතව කටයුතු කළ යුතුය. යම්හෙයකින් එකී උපදෙස් වලට අනුගත වීම ප්‍රධානියාට අවාසිදායක ප්‍රතිඵලයක් උද්ගත කරන්නේ වුවද ප්‍රධානියාගේ උපදෙස් අනුගමනය කිරීමට නියෝජිතයා බැඳී සිටී. නියෝජිතයා විසින් එසේ ප්‍රධානියාගේ උපදෙස් වලට අනුගත නොවීම නිසා ප්‍රධානියාට යම් අලාභයක් සිදුවුවහොත් වී සඳහා නියෝජිතයා විසින් පුද්ගලිකව වගකිව යුතුය.

<u>Turpin</u> V <u>Bilton</u> (1843) 5 Man & G 455

මෙහිදී ප්‍රධානියාගේ නැවක් රක්ෂණය කිරීමට නියෝජිතයෙකු පත් කරන ලදී. එහෙත් නියෝජිතයා එම උපදෙස් අනුව කටයුතු නොකිරීම නිසා නැව රක්ෂණය කර නොතිබුණි. මේ අතර තුර නැව මුහුදේදී විනාශ විය. මෙම සිද්ධියට අදාලව අධිකරණය ප්‍රකාශ කලේ නියෝජිතයා ප්‍රධානියාගේ උපදෙස් පිළි නොපැදීම හේතුවෙන් ප්‍රධානියාට වූ අලාභය නියෝජිතයා ගෙවිය යුතු බවයි.

<u>Ferress</u> V <u>Robins</u>

JMC vLearning "your virtual learning partner"

මෙහිදී ප්‍රධානියා විසින් නියෝජිතයා උපදෙස් ලබා දී තිබුණේ භාණ්ඩ අත්පිට මුදලට විකුණන ලෙසය. කෙසේනමුත් වෙන්දේසිකරු විනිමය බිල්පතකට භාණ්ඩ අලෙවි කරන ලදී. විනිමය බිල්පත අගරු වූ අතර නියෝජිතයා විසින් වෙන්දේසිකරු විසින් ප්‍රධානියාගේ උපදෙස් අනුගමනය කර නොමැති වීම නිසා සිදු වූ අලාභය නියෝජිතයා විසින් දැරිය යුතු බව අධිකරණය තීරණය කරන ලදී.

## ii. සැලකිලිමත් වීම හෙවත් නොසැලිකිලිමත් නොවීම

එනම් සෑම නියෝජිතයෙක්ම ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කිරීමේදී සැලකිලිමත් විය යුතුය. කිසියම් නියෝජිතයෙක් නොසැලිකිලිමත් වීම හේතුකොට ගෙන ප්‍රධානියාට කිසියම් අලාභයක් සිදුවුවහොත් එම අලාභය නියෝජිතයා විසින් ප්‍රධානියාට ගෙවිය යුතුය. මෙහිදී සැලකිලිමත්භාවය සාමාන්‍ය බුද්ධිමත් මිනිසාගේ මිණුම් දණ්ඩ අනුව තීරණය කරනු ලබයි. ඒ අනුව සාමාන්‍ය බුද්ධිමත් මිනිසෙකු දක්වන සැලකිල්ලේ ප්‍රමාණය නියෝජිතයාගෙන් අපේක්ෂා කෙරේ. කෙසේනමුත් නියෝජිතයා අදාළ කාර්යයට විශේෂඥයෙකු වේ නම් ඔහුගෙන් අපේක්ෂා කරනුයේ විශේෂඥ සැලකිල්ලකි.

Keppel V Wheeler (1972) 1 KB 755

මෙම නඩුවේදී නියොජිතයාගේ කාර්යය වූයේ දේපළක් විකිණීම සඳහා ගැණුම්කරුවන් සොයා දීමයි. ඔහු විසින් ඉහළ සහිත ගැණුම්කරුවෙකු ප්‍රධානියා වෙත දැනුම් දෙන ලදී. පසුව එම ඉල්ලුම අභිබවා ගිය ඉල්ලුම්කරුවෙකු මුණ ගැසුණ ද ඒ පිළිබඳව දැනුම් දීම නියෝජිතයා විසින් නොසලකා හරින ලදී. මේ සම්බන්ධයෙන් අධිකරණය ප්‍රකාශ කර සිටියේ නියෝජිතය සැලකිලිමත්භාවයේ යුතුකම උල්ලංඝණය කොට ඇති බවයි.

Chaudry V Prabakar (1989) WLR 29

මෙම නඩුවේදී C විසින් සිය මිතුරෙකු වූ P ට තමාට අනතුරට පත්ව අලුත්වැඩියා නොකරන ලද මෝටර් රථයක් මිලට ගෙන දෙන ලෙස ඉල්ලා සිටියාය. එම කාර්යය වෙනුවෙන් P කිසිදු ගෙවීමක් ලබන්නේ නැත. P මෝටර් රථයක් C ට යෝජනා කරන ලද අතර ඔහු එම මෝටර් රථයේ ඉදිරිපස වර්ණ ගන්වා ඇති බවක් නිරීක්ෂණය කොට තිබේ. කෙසේනමුත් මෝටර් රථය අනතුරට ලක් වූ එකක්දැයි P විකුණුම්කරුගෙන් ප්‍රශ්න නොකරන ලදී. ඒ අනුව මෝටර් රථ පිළිබඳව කිසිදු දැනීමක් නොමැති C, P ගේ නිර්දේශය මත මෝටර් රථය මිලට ගත්තාය. පසුව අනාවරණය වූයේ මෝටර් රථය අනතුරට ලක්ව අළුත්වැඩියා කර ඇති බවයි. මේ සම්බන්ධයෙන් අධිකරණය ප්‍රකාශ කලේ P විසින් සැලකිලිමත්භාවයේ යුතුකම උල්ලංඝණය කර ඇති නිසා C වෙත වන්දි ගෙවීමට බැඳී සිටින බවයි.

## iii. ප්‍රධානියාගේ රහස්‍ය ව්‍යාපාරික තොරතුරු ප්‍රධානියාගේ අවසරය හෝ නීතියෙන් නියම කරන ලද අවස්ථාවකදී හැර කිසිවෙකුට එළිදරව් නොකළ යුතුය.

නියෝජිත සම්බන්ධයේ ප්‍රතිඵලයක් ලෙස නියෝජිතයා විසින් ප්‍රධානියා සම්බන්ධයෙන් අත්පත් කර ගන්නා තොරතුරු වෙනත් අයට හෙලි නොකිරීමට හා තමාගේ ප්‍රයෝජනය පිණිස යොදා නොගැනීමට ඇති යුතුකමයි. නියෝජිතයා යනු මෙම රහස්‍යභාවයේ යුතුකම නියෝජ්‍යත්වය පවතින විටදී මෙන්ම නියෝජ්‍යත්වය අවසන් වූ පසුවද නොවෙනස්ව පවතී.

AG V Blake (2001) 1 AC 268


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

මෙම නඩුවේදී අධිකරණය ප්‍රකාශ කරන ලද්දේ නියෝජිතයෙකුව සිටියදී ලබාගත් තොරතුරු භාවිතා කරමින් නියෝජ්‍යත්වය අවසන් වූ පසු අයුතු ලාභ ලැබීම රහස්‍යභාවයේ යුතුකම උල්ලංඝණය කිරීමක් වන බවයි.

### iv. ගිණුම් ඉදිරිපත් කිරීම

නියෝජිතයෙකු තම කාර්යය ඉටු කිරීමේදී දැරූ වියදම් හා ලැබූ ආදායම් පිළිබඳව සම්පූර්ණ වශයෙන් වාර්තා කිරීමේ යුතුකමක් නියෝජිතයාට ඇත. නමුත් මෙහිදී ද්විත්ව සටහන් ක්‍රමයට ගිණුම් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය නොවේ.

### v. නියෝජිතයා හා ප්‍රධානියා අතර ඔවුන්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා අතර ගැටීමක් (Conflict of Interest) ඇතිවන තත්ත්වයකට නියෝජිතයෙකු තමාව පත්කර ගැනීමෙන් වැලකී සිටීම.

නියෝජිතයා ප්‍රධානියාගේ ඇල්ම වෙනුවෙන් කටයුතු කළ යුතු බවත් නියෝජිත සම්බන්ධතාවය තුලදී සිය ඇල්ම වෙනුවෙන් කටයුතු නොකළ යුතු බවත් මින් අදහස් වේ. ඒ අනුව නියෝජිතයා නියෝජිතයෙකු ලෙස කටයුතු කරන අතරතුර තමා වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීමත්, ප්‍රධානියා සමඟ තරඟ නොකිරීමත් සිදු කළ යුතුය. මෙහිදී නියෝජිතයා විසින් සත්භාවයෙන් කටයුතු කොට ප්‍රධානියාට ලාභ උපයා දී තිබුණේ වුවද ඔහු අයිතිවාසිකම් ඝට්ටනය වන තත්ත්වයක් උද්ගත කරගෙන ඇත්තේ නම් එය නියෝජිතයාගේ යුතුකමක් කඩ කිරීමක් වශයෙන් සැලකෙන බව අධිකරණය විසින් තීරණය කොට ඇත.

<u>Armstron</u> V <u>Jackson</u> (1917) 2KB 822

මෙහිදී ප්‍රධානියා සමාගම්වල කොටස් මිලට ගැනීම සඳහා නියෝජිතයෙකු පත් කරන ලදී. නියෝජිතයා විසින් තමාට අයත් කොටස් ප්‍රධානියාට විකිණීය. මෙම සිද්ධිය අලලා අධිකරණය ප්‍රකාශ කලේ නියෝජිතයා ගිවිසුම් වලට එළැඹ ඇත්තේ ප්‍රධානියා වෙනුවෙන් නොව තමා වෙනුවෙන් බවයි. එහිදී සම්බන්ධතා අතර ගැටුමක් ඇතිවන බවයි. එනම් ප්‍රධානියා කෙරෙහි ඇති යුතුකම් කඩකර ඇති බවයි.

### vi. ප්‍රධානියා විසින් නියෝජිතයාට ලබා දෙන බලතල වෙනත් කිසිවෙකුට නොපැවරිය යුතුය.

මෙම යුතුකම යන delegarus non potes delegare ලතින් ආප්තිය මත පදනම් වේ. එහි අර්ථය වනුයේ බලය පවරනු ලැබ සිටි තැනැත්තෙකුට, එම බලය තවත් තැනැත්තෙකුට පැවරිය නොහැකි බවයි. ඒ අනුව නියෝජිතයා විසින් ප්‍රධානියාගේ කාර්යයන් වෙනුවෙන් උපනියෝජිතයින් පත් කිරීමෙන් වැළකී තමාම පෞද්ගලිකව ප්‍රධානියාගේ කාර්යය ඉටු කළ යුතුය.

<u>John McCann & Col</u> V <u>Paw</u> (1975) AER 129

මෙම නඩුවේදී තට්ටු නිවාසයක් විකිණීම සඳහා දේපළ වෙළඳ ආයතනයක් නියෝජිතයින් ලෙස පත් කරන ලදී. මෙම වෙළඳ ආයතනය ප්‍රධානියාගේ අනුමැතියකින් තොරව උප නියෝජිතයන් මේ සඳහා පත් කරන ලදී. තට්ටු නිවාසය ඉල්ලුම් කළ මුදලට විකුණන ලදී. මෙහිදී අධිකරණය තීරණය කරන ලද්දේ එම උපනියෝජිතයන්ට කොමිස් මුදලක් ලබා දීමට ප්‍රධානියා වගකීමට යටත් නොවන බවයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

කෙසේනමුත් මෙම රීතියට පහත ව්‍යාතිරේඛීය අවස්ථා දක්නට ලැබේ.

I. ප්‍රකාශිතව හෝ ව්‍යංගව ප්‍රධානියා විසින් බලය අභිනියෝජනය කිරීමට නියෝජිතයාට අවස්ථාව ලාබ දී ඇති විට.

II. පවරන ලද කාර්යය විශේෂ හැකියාවක් හෝ ප්‍රතිභාවක් බලාපොරොත්තු නොවන දෙයක් වීම.

III. අභිනියෝජනය කරන ලද බලය ප්‍රධානියා අපරානුමත කිරීම.

**vii. රහස් ලාභ හෝ අල්ලස් නොලැබීම**

නියෝජිතයෙකු විසින් ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කිරීමේදී රහස් ලාභ ඉපැයීම නොකල යුතුය. කිසියම් රහස් ලාභයක් උපයාගෙන ඇති විට එවැනි නියෝජිතයෙකුට එරෙහිව මෙන්ම නියෝජිතයාට රහස් ලාභ ගෙවන ලද තෙවැනි පාර්ශවයට එරෙහිවද පහත සඳහන් ප්‍රතිකර්ම හිමි වේ.

**නියෝජිතයාට එරෙහිව ඇති අයිතීන්**

I. නියෝජිතනයාට කිසියම් කොමිස් මුදලක් ගෙවිය යුතු වන විට එය නොගෙවා සිටිය හැක.

II. නියෝජිතයා විසින් උපයා ඇති රහස් ලාභය නියෝජිතයාගෙන් අයකර ගත හැකිය.

III. නියෝජිතයාගේ නියෝජ්‍යත්වය අවසන් කළ හැකිය.

**නියෝජිතයාට රහස් ලාභයක් ගෙවා ඇති තෙවන පාර්ශවයකට එරෙහිව ප්‍රධානියාට ඇති අයිතීන්**

I. තෙවන පාර්ශවය සමඟ තිබෙන්නා වූ ගිවිසුම අවසන් කර දැමීම.

II. නියෝජිතයාට ගෙවන ලද රහස් ලාභය තෙවන පාර්ශවයෙන් අයකර ගැනීම.

<u>Salford Corporation</u> V <u>Lever</u>

මෙහිදී S විසින් ගල් අඟුරු සඳහා ටෙන්ඩර් කැඳවන ලදී. L විසින් ද ටෙන්ඩරයක් ඉදිරිපත් කරන ලද අතර එම ටෙන්ඩර් කමිටුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරන ලද කළමනාකරු සමඟ L විසින් ඇති කරගත් ගිවිසුමක් අනුව L ගේ ටෙන්ඩරය S විසින් පිළිගනු ලැබුවහොත් කළමනාකරුට සපයනු ලබන සෑම ගල් අඟුරු ටොන් එකකටම සිලිම් බැගින් ගෙවීමට L එකඟ විය. S හට මේ බව පසුව අනාවරණය වූ විට S ගේ නියෝජිතයා වන කළමනාකරු විසින් උපයා තිබෙන රහස් ලාභය ඔහුගෙන් අයකර ගැනීමෙන් පසුව L ගෙන්ද අයකර ගැනීමට නඩු පවරන ලදී. මෙහිදී අධිකරණය ප්‍රකාශ කළේ කිසියම් නියෝජිතයෙකුට රහස් ලාභයක් ගෙවා ඇති විටකදී එම රහස් ලාභ නියෝජිතයාගෙන් මෙන්ම තෙවන පාර්ශවයෙන් ද අයකර ගැනීමට ප්‍රධානියාට අයිතියක් තිබෙන නිසා L ගෙන්ද මෙම රහස් ලාභය අය කර ගැනීමට S ට අයිතියක් ඇති බවයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**viii. ගිවිසුම අවසන් කරන අවස්ථාවකදී නියෝජිතයා සතු ප්‍රධානියාගේ වත්කම් හා සියළුම ලේඛන ප්‍රධානියාට නැවත පවරා දීම.**

**ප්‍රධානියාගේ යුතුකම්**

i. පාරිශ්‍රමික යුතුකම්

නියෝජිතයෙකු හට ගෙවිය යුතු කිසියම් කොමිස් මුදලක් හෝ වේතනයක් තිබේ නම් එය නොපමාව ප්‍රධානියා විසින් ගෙවිය යුතුය. පාරිතෝෂිකය ප්‍රකාශිත විය හැකි සේම ප්‍රධානියා හා නියෝජිත සම්බන්ධතාවයේ ව්‍යංග කොන්දේසියක් ද විය හැකිය. ඒ අනුව ගිවිසුමක ප්‍රකාශිතව සඳහන් කර නොමැති වුවද සම්ප්‍රදාය, පරිචයන් හා වෙළඳ පුරුදු අනුව නියෝජිතයාට පාරිශ්‍රමික ගෙවීමට ප්‍රධානියා බැඳී සිටියි.

ii. නියෝජිතනයෙක් විසින් ප්‍රධානියෙක් වෙනුවෙන් කටයුතු කිරීමේදී දරන ලද වියදම්, අලාභ, වගකීම් යනාදිය ප්‍රතිපූර්ණය කළ යුතුය.

නියෝජිතයා සිය සත්‍ය හෝ ව්‍යංග උධිකාරිය යටතේ කටයුතු කිරීමේදී ඔහුට දරන්නට සිදු වූ සියළුම වියදම්, අලාභ, වගකීම් යනාදිය නොපමාව ප්‍රතිපූර්ණය කිරීමේ යුතුකම ප්‍රධානියා සතු වෙයි.

<u>Adamson</u> V <u>Javnis</u>

මෙම නඩුවේදී වෙන්දේසිකරුවෙකු ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ විකිණීමෙන් සිදු කරන ලදී. නමුත් මෙම භාණ්ඩ විකුණන අවස්ථාවේදී භාණ්ඩවල නිසි අයිතිය ප්‍රධානියා සතු නොවූ නිසා ගැණුම්කරුට වන්දි ගෙවීමට නියෝජිතයාට සිදු විය. අධිකරණය ප්‍රකාශ කලේ නියෝජිතයාට දරන්නට සිදු වූ වියදම ප්‍රධානියාගෙන් අයකර ගැනීමට අයිතිවාසිකමක් පවතින බවයි.

කෙසේනමුත් පහත අවස්ථාවන්හි දී නියෝජිතයා විසින් දරන්නට යෙදුණු වියදම්, අලාභ, වගකීම් යනාදිය ප්‍රතිපූර්ණය කිරීමට ප්‍රධානියා බැඳී නොසිටියි.

I. නියෝජිතයා සිය සත්‍ය බලය අභිබවා කටයුතු කර ඇති අවස්ථා වලදී

II. නියෝජිතයා විසින් නොසැලිකිමත්ව කටයුතු කර ඇති අවස්ථාවකදී හෝ යුතුකම් කඩ කොට ඇති අවස්ථාවකදී

III. නියෝජිතයා විසින් සිදු කර ඇති නීතිවිරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් දරන්නට සිදු වූ වියදම්

## නියෝජිතයාගේ අයිතිවාසිකම්

ඉහත සඳහන් කළ ප්‍රධානියාගේ යුතුකම් දෙක නියෝජිතයාගේ අයිතාවාසිකම් වේ. මීට අමතරව ප්‍රධානියාගෙන් අයවිය යුතු කොමිස් මුදලක් හෝ වේතනයක් නොගෙවා ඇති විටක එම වේතනය හෝ කොමිස් මුදල ගෙවන තෙක් නියෝජිතයා ලඟ ඇති ප්‍රධානියාගේ භාණ්ඩ ප්‍රධානියාට භාර නොදී කොමිස් මුදල හෝ වේතනය ගෙවීමට පෙළඹවීමක් වශයෙන් ප්‍රධානියාගේ භාණ්ඩ තම භාරයේ තබා ගෙන සිටින බලය හෙවත් ලියම බලය ක්‍රියාත්මක කළ හැකිය. නියෝජිතයාට මෙම බලය ක්‍රියාත්මක කළ හැක්කේ ඔහු විසින් නිත්‍යානුකූල ආකාරයට සන්තකය ලබාගත් භාණ්ඩ සඳහා පමණි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## නියෝජිතයා විසින් ප්‍රධානියා හෙළිදරව් කිරීමේ හා නොකිරීමේ නෛතික ප්‍රතිඵල

මෙම පරිච්ඡේදය ආරම්භයේදී සාකච්ඡා කළ පරිදි සාමාන්‍යයෙන් නියෝජිතයෙකු ගිවිසුමකට එළඹි පසු ඔහු තුන්වන පාර්ශවය සමඟ බැඳීමකට ලක් නොවේ. නියෝජිතයෙකු වශයෙන් ඔහුගේ කාර්යය අවසන් වූ පසු ඔහු ගිවිසුමෙන් මැකී යන අතර ප්‍රධානියා හා තුන්වන පාර්ශවය ගිවිසුම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් වේ.

නියෝජ්‍යත්ව නීතියේ මෙම සාමාන්‍ය ප්‍රතිවිපාකය ඇති වීමට නම් නියෝජිතයා මෙම පරිච්ඡේදයේ දී පූර්වයෙන් සඳහන් කළ කවර හෝ අධිකාරියක් යටතේ කටයුතු කළ යුතුය. නොඑසේනම් ගිවිසුමෙන් නියෝජිතයා පෞද්ගලිකව බැඳේ.

එසේම නියෝජිතයා තුන්වන පාර්ශවයන් සමඟ ගිවිසුමට එළඹිය යුත්තේ තමා නියෝජිතයෙකු බව හෙළිදරව් කරමින්ය. එසේ නොවන අවස්ථා වලදී නියෝජ්‍යත්ව නීතියේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයට පටහැනිව නියෝජිතයා පෞද්ගලිකව වගකීමට ලක්විය හැකිය. නියෝජිතයා විසින් නියෝජ්‍යත්වය හෙලි කිරීමේ හෝ නොකිරීමේ නෛතික ප්‍රතිවිපාක මෙම පරිච්ඡේදයේදී සාකච්ඡා කරනු ලබයි.

## ප්‍රධානියා පිළිබඳව හෙළිදරව් නොකරන ලද අවස්ථාව

නියෝජිතයා විසින් ප්‍රධානියා පිළිබඳව හෙළිදරව් නොකරමින් ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවකදී තුන්වන පාර්ශවය සම්බන්ධයෙන් වගකීම් ඉටු කිරීමට නෛතිකව බැඳී සිටිනුයේ ප්‍රධානියා ද නියෝජිතයා ද යන ගැටළුව ඉස්මතු වේ. අධිකරණ විසින් මේ සම්බන්ධයෙන් යම් මඟ පෙන්වීමක් දක්වා ඇති අතර ඒ අනුව කිසියම් නියෝජිතයෙක් තමා ගිවිසුමකට එළැඹෙන විට තමා නියෝජිතයෙක් බවත් නියෝජිතයෙක් වශයෙන් ගිවිසුමකට එළැඹෙන බවත් සඳහන් නොකර ගිවිසුමකට එළඹ ඇත්නම් තෙවන පාර්ශවයට තමන් එළැඹුණා වූ ගිවිසුමෙන් **වගකීමට** බැඳීම සඳහා එක්කෝ ප්‍රධානියා නැත්නම් නියෝජිතයා තෝරා ගත හැකිය. නමුත් මේ දෙදෙනාම තෝරා ගත නොහැකිය.

<u>Clarkson Booker Ltd.V Andjel</u> (1964) 2 QB 775

මෙම නඩුවේදී ʼ විසින් ක නැමැති ගුවන් සේවා ආයතනයෙන් නියෝජ්‍යත්වය හෙලිදරව් නොකරමින් ඡ වෙනුවෙන් ගුවන් ටිකට්පත් මිලදී ගත්තේය. ක විසින් පසුව ʼ කටයුතු කොට ඇත්තේ ඡ වෙනුවෙන් බව අනාවරණය කරගනු ලැබූ අතර දෙදෙනාගෙන්ම ගුවන් ටිකට්පත් සඳහා මුදල් ඉල්ලා සිටියේය. පසුව ඡ වස්තු භංගත්වයට පත්ව ඇති බව අනාවරණය වූ අතර ක විසින් නියෝජිතයා වූ ʼ ට විරුද්ධව නඩු පවරා අලාභ ඉල්ලා සිටින ලදී. එහිදී අධිකරණය ප්‍රකාශ කර සිටියේ ගිවිසුමකට එළඹෙන අවස්ථාවේදී ʼ විසින් නියෝජ්‍යත්වය හෙලිදරව් කොට නොමැති නිසා ඔහු ගිවිසුම සම්බන්ධයෙන් පෞද්ගලිකව වගකීමට බැඳිය යුතු බවයි.

අනෙක් අතට සාකච්ඡා කළ යුතු වැදගත්ම කරුණ වනුයේ නියෝජිතයා විසින් ප්‍රධානියා පිළිබඳව හෙළිදරව් නොකරමින් ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවකදී තුන්වන පාර්ශවය සම්බන්ධයෙන් ඇති **අයිතිවාසිකම් බලගන්වා ගැනීමට** ගිවිසුමට මැදිහත් වීමට අයිතියක් ඇත්ද යන්නයි. මෙවැනි අවස්ථාවලදී ගිවිසුම සඳහා මැදිහත් වීමට ප්‍රධානියාට අයිතියක් ඇති බව අධිකරණ විසින් පිළිගෙන තිබුණ ද එම අයිතිය ව්‍යාතිරේඛ වලට යටත් වේ. ඒ ප්‍රධානියෙක් පිළිබඳ හෙළිදරව් නොකරන ලද අවස්ථා වලදී තෙවන පාර්ශවයන් විසින් එවැනි ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිසුම් වලට එළැඹීමට කිසිසේත්ම අදහස් කර නැත්නම් එවැනි ගිවිසුමක් සඳහා ප්‍රධානියාට මැදිහත් විය නොහැක. එසේම තවදුරටත් පුද්ගලික ස්වභාවයේ ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රධානියාට මැදිහත් විය නොහැක.

<u>Said</u> V <u>Butt</u> 1920 3 KB 497

මෙහිදී නාට්‍ය ශාලාවක කළමනාකරු වූ A සමඟ B හට පෞද්ගලික ආරවුලක් විය. B විසින් මෙම නාට්‍ය ශාලාවේ රඟ දැක්වෙන කිසියම් සංදර්ශනයක් සඳහා අවශ්‍ය ප්‍රවේශ පත්‍රයක් C මඟින් මිලට


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ගෙන නාට්‍ය ශාලාවට ඇතුළු වීමට උත්සා දරන විට A එයට ඉඩ නොදෙන ලදී. මේ සම්බන්ධව පැන නැගුන නඩුවේදී අධිකරණය ප්‍රකාශ කලේ C විසින් ප්‍රධානියෙකු හෙළි නොකරන ලද නිසා A අකමැතිනම් මෙම ගිවිසුමට ඇතුලත් වීමට B ට අයිතියක් නැති බවයි.

## ප්‍රධානියා පිළිබඳව හෙළිදරව් කරන ලද අවස්ථා

**1. ප්‍රධානියා නම් කරන ලද අවස්ථා**

කිසියම් නියෝජිතයෙක් තම ගිවිසුමට එළැඹෙන විට තමා නියෝජිතයෙක් බවත් නියෝජිතයෙක් වශයෙන් ගිවිසුමට එළඹෙන බවත් ප්‍රධානියාගේ නමත් සඳහන් කර ගිවිසුමකට එළැඹ ඇත්නම් ගිවිසුමට එළැඹි වහාම නියෝජිතයා ගිවිසුමෙන් ඉවත්ව ගොස් ප්‍රධානියා හා තෙවන පාර්ශවය අතර එම ගිවිසුම සම්බන්ධ වගකීම් හට ගනී.

නමුත් මෙහිදී ප්‍රධානියාගේ නම ලියා ප්‍රධානියා වෙනුවෙන් ඔහුගේ නියෝජිතයා ලෙස ගිවිසුමට අත්සන් කර නොමැති නම් නියෝජිතයා වගකීමට බැඳේ. මේ තත්ත්වය ඔප්පු හා ගණුදෙණු කළ හැකි ලියවිලි සම්බන්ධයෙන් බොහෝවිට යෙදේ. ඒ අනුව පැහැදිලි ලෙස නියෝජ්‍යත්වය හෙළිවන පරිදි කටයුතු කිරීමට නියෝජිතයා වගබලා ගත යුතුය.

උදාහරණ:

| | |
|---|---|
| Sumanapala | Sumanapala |
| කළමනාකරු XYZ සමාගම වෙනුවෙන් | කළමනාකරු XYZ සමාගම වෙනුවෙන් |
| **ප්‍රධානියා වගකීමට බැඳේ** | **නියෝජිතයා වගකීමට බැඳේ** |

**2. ප්‍රධානියා නම් නොකරන ලද අවස්ථා**

කිසියම් නියෝජිතයෙක් තමා ගිවිසුමට එළැඹෙන විට තමා නියෝජිතයෙක් බවත් නියෝජිතයෙක් වශයෙන් ගිවිසුමකට එළැඹෙන බවත් සඳහන් කර ඇති නමුත් ප්‍රධානියාගේ නමක් සඳහන් කර නැති අවස්ථා වලදී නෛතික ප්‍රතිඵලය වන්නේ ප්‍රධානියා පිළඹඳව නම් කරන ලද රීතිය යටතේ එළැඹුණා වූ ගිවිසුමකට නෛතික ප්‍රතිඵලය වේ. එනම් ගිවිසුමට එළැඹි වහාම නියෝජිතයා ගිවිසුමෙන් ඉවත් වන අතර ප්‍රධානියා තෙවන පාර්ශවය අතර එම ගිවිසුම සම්බන්ධ වගකීම් හට ගනී. එසේම ප්‍රධානියා පිළිබඳව නම් කරන ලද රීතිය යටතේ සඳහන් කර ඇති ව්‍යාතිරේඛ අවස්ථා ද මේ යටතේ යෙදේ.

## නියෝජ්‍යත්වය අවසන් වීම

ප්‍රධානියා හා නියෝජිතයා අතර පවත්නා සම්බන්ධතාවය අවසන් වීම ආකාර දෙකකින් සිදු වේ.

**නීතියේ ක්‍රියාත්මක වීමෙන් නියෝජ්‍යත්වය අවසන් වීම**

i. ප්‍රධානියාගේ හෝ නියෝජිතයාගේ මානසික නොහැකියාව හෝ මරණය

ii. ප්‍රධානියාගේ වස්තු භංගත්වය

iii. ගිවිසුමේ විෂය වස්තුව ව්‍යවර්ථ වීම
උදා: ගිවිසුමේ විෂය කාරණය පසුව අනීතික වීම

**පාර්ශවයන්ගේ ක්‍රියාකාරීත්වයෙන් නියෝජ්‍යත්වය අවසන් වීම**

i. ඉෂ්ඨ කිරීම මඟින් නියෝජ්‍යත්වය අවසාන වීම
උදා: විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් මඟින් නඩුවක පෙනී සිටීමට ලබා දුන් නියෝජ්‍යත්ව අධිකාරිය එම නඩුව අවසන් වීමත් සමඟ අවසන් වී යයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ii. දෙපාර්ශවය එකඟත්වයෙන් නියෝජ්‍යත්වය සමාප්ත වීම.
iii. ප්‍රධානියා විසින් නියෝජ්‍යත්ව බලය ඉල්ලා අස්කර ගැනීම මඟින්
iv. නියෝජිතයා විසින් නියෝජ්‍යත්වය අතහැරීම මඟින්

**නියෝජිතයෙකුගේ වගකීම්**

නියෝජිතයාගේ යුතුකම් යටතේ සාකච්ඡා කොට ඇත.

## නියෝජිතයෙකුගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් රජයේ වගකීම

1969 අංක 22 දරන දිලික්තයකදී රජයේ වගකීම් පනත අනුව රජයේ නියෝජිතයන් සිදු කරනු ලබන දිලික්තයන් සඳහා රජයේ ප්‍රධානියා වශයෙන් වගකිව යුතුය. එසේම රජයේ අධිකාරී බලය ඇතිව යම් ප්‍රත්‍යක්ෂණයක් හෝ යම් වෙළඳ ලකුණක් හෝ ප්‍රකාශන අයිතියක් රජයේ නියෝජිතයෙක් විසින් උල්ලංඝණය කරයි නම් ඒ සම්බන්ධයෙන් ද රජය වගකව යුතු වේ.

කෙසේනමුත් තැපැල් භාණ්ඩයක් සම්බන්ධයෙන් රජයේ යම් නියෝජිතයෙකුගේ ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ සන්නද්ධ රාජකාරියේ යෙදී සිටින සෙබලෙකුගේ ක්‍රියාවක් වශයෙන් රජය, ප්‍රධානියා වශයෙන් වගකිව යුතු නොවේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd